**ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුව**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 අප්‍රේල් 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේදයට යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශ | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (අ) | වෘත්තීය පුහුණු ආයතන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලැබුණු අක්කර 33 ක | 1.6.1 (අ) (ආ) |

| | | |
|---|---|---|
| | පමණ වර්ග ප්‍රමාණයකින් යුත් ඉඩම් 05 ක් පරිත්‍යාග කර වර්ෂ 10 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණ ද, එකී ඉඩම්වල හා එහි ඉදිකර තිබුණු ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | |
| 2.6 (ආ) | රජයේ වාහනයක් ඉගෙනුම් ආධාරකයක් වශයෙන් පරිහරණය කරන්නේ නම් නිසි ක්‍රමවේදයන්ට අනුව වාහනය අපහරණය කොට ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසුව එය සිදු කළ යුතු වුවත්, ධාවනය කළ හැකි තත්ත්වය පවතින ලියාපදිංචි අංක තහඩුවක් සහිත නිසාන් වර්ගයේ ඩබල් කැබ් රථය කැටවල වෘත්තිය පුහුණු ආයතනයේ මෝටර් යාන්ත්‍රික ශිල්පීය ඉගෙනුම සඳහා යොදවා තිබුණි. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ගේ තොරතුරු අනුව එම රථය කාන්තා සවිබල ගැන්වීම් හා සමාජ සුබසාධන අමාත්‍යාංශ ලේකම් නමින් ලියාපදිංචිය වූ අතර ඉගෙනුම් ආධාරකයක් වශයෙන් යොදවා ගැනීම නිසි අධිකාරි බලයකින් තොරව සිදු වී තිබුණි. | 2.3 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාල මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය<br>------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|---|
| (අ) | වෘත්තීය පුහුණු ආයතන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුවට | පවරා නොගත් ඉඩම් හා ගොඩනැගිලි වල තක්සේරු වාර්තාව පවරා ගැනීම අවසන් වූ පසු ලබා ගැනීමට කටයුතු කරන බව. | ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු අක්කර 29ක පමණ වර්ග ප්‍රමාණයකින් යුත් ඉඩම් 06 ක් පරිත්‍යාග කර වර්ෂ 11 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණ ද, එකී ඉඩම්වල හා එහි ඉදිකර තිබුණු ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ආ) | වෘත්තීය පුහුණු ආයතන 07 ක් ස්ථාපිත කර තිබුණු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබීම හා වටිනාකම තක්සේරු කර නොතිබූ අතර ඉකුත් වර්ෂ 11 කට වැඩි කාලයක් තුල ඉදිකර තිබුණු ගොඩනැගිලි පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ ගොඩනැගිලි හා ඉදිකිරීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පවරා නොගත් ඉඩම් හා ගොඩනැගිලි වල තක්සේරු වාර්තාව පවරා ගැනීම අවසන් වූ පසු ලබා ගැනීමට කටයුතු කරන බව. | ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කලයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය<br>----------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන | පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කලට සමාලෝචනය සිදු කරනු ලබන බවත්, පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් ද සිදු කරනු ලබන අතර ඉදිරියේ දි මෙම සිදුකරනු ලබන වෙනස්කම් පිළිබඳව දැනුවත් කිරීමට පියවර ගන්නා බව. | අභ්‍යන්තර පාලන පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සමාලෝචනයන් හා වෙනස්කම් සිදු කර එහි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණද, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 අවිධිමත් ගනුදෙනු

### අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගනුදෙනු කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ වාහනයක් ඉගෙනුම් ආධාරයක් වශයෙන් පරිහරණය කරන්නේ නම් නිසි ක්‍රමවේදයක් අනුව වාහනය අපහරණය කොට ලියාපදිංචිය මෝටර් රථ ආඥා පනත ප්‍රකාරව අවලංගු කිරීමෙන් පසු යොදාගත යුතු වුවත් වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයේ ඇති වාහන 5 ක වැසි අංක ද සහිතව ඉගෙනුම් ආධාරක වශයෙන් යොදා ගෙන තිබුණි. තවද වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයේ තිබෙන යතුරු පැදි 19 ක් කැටවල වෘත්තීය පුහුණු ආයතනය වෙත රැගෙන ගොස් තිබූ නමුත් යතුරු පැදිවල අංක තහඩු සහිතව එම ආයතනයේ රඳවා ගෙන තිබුණි. | ලියාපදිංචිය අවලංගු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරදෙන ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා ඇති බව. | වාහනය ලියාපදිංචිය අවලංගු කර අපහරණ කටයුතු සිදු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය<br>----------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------- | නිර්දේශය<br>------- |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මෙහෙවර වන "ඉලක්ක ගත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබල ගැන්වීම තුළින් සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තියවේදීමය මැදිහත්වීම මඟින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම" වෙනුවෙන් දෙපාර්තමේන්තුව සිදු කරන කාර්යයන් තුල නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම හා ප්‍රතිපත්ති සම්පදානය සිදු කල යුතු වුවද ප්‍රමාණවත් කාර්යයක් ඉටු කර නොතිබුණි. | කුඩා ව්‍යාපාර ව්‍යවසායකයින් සමඟ සම්බන්ධ වී වෘත්තීය පුහුණු ආයතන වල පාඨමාලා හදාරා අවසන් වූ අභ්‍යාසලාභීන් සඳහා ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම. ඒ තුලින් ස්වයංරැකියා සඳහා තරුණ තරුණියන් යොමු කිරීමට කටයුතු සකස් කරමින් පවතින බව. | අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට හැකිවන පරිදි කඩිනමින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ කාර්යක්ෂමව හා සපලදායීව ප්‍රතිපත්ති සම්පාදනය කල යුතුය. |

.

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>-------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------- | නිර්දේශය<br>---------- |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී දෘෂ්‍යාබාධිත අරමුදල යටතේ දෘෂ්‍යාබාධිත පුද්ගලයින් 10 දෙනෙකු සඳහා ක්‍රීඩා වෙනුවෙන් ආධාර ලබා දීමට රු. 100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත් කිසිඳු පුද්ගලයකු සඳහා ආධාර ලබා දි නොතිබුනි. | ක්‍රීඩා උපකරණ ලබා දීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් හා අනෙකුත් වියදම් සඳහා වෙන්වූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ක්‍රීඩා ආධාර සඳහා වෙන්වූ ප්‍රතිපාදන අත්‍යාවශ්‍ය වියදම් සඳහා යොදාගත් බව. | අදාල අරමුණ ඉටුකර ගැනීමට ප්‍රතිපාදන කඩිනමින් යොදාගත යුතුය. |

### 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කොට 2022 දෙසැම්බර් 20 දින විවෘත කරන ලද කිලිනොච්චි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදි කිරීම් වෙනුවෙන් රු. 1,280,000 ක් වැය කර තිබුණු අතර ඉඩමෙහි වටිනාකම රු. 93,630,000 ක් විය. සමාලෝචිත වර්ෂයේ මැයි මාසයේදී පාඨමාලා දෙකක් සඳහා අභ්‍යාසලාභින් බඳවාගෙන පාඨමාලා ආරම්භ කර තිබුණද 2024 ජනවාරි වන විට උපදේශකවරුන් නොමැතිකම නිසා පාඨමාලා පැවැත්වීම නවතා තිබුණි. සියළු පහසුකම් සහිතව විශාල මුදලක් වැය කර ඉදිකරන ලද මෙම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය මේ වන විට මධ්‍යස්ථාන භාර නිලධාරි, සංවර්ධන නිලධාරි යන නිලධාරින් පමණක් අනුයුක්තව නිශ්කාර්යව සිටින අතර ආරක්ෂක අංශයට සහ පවිත්‍රතා අංශය වෙනුවෙන් ද ගෙවීම් කරමින් පවතී. ඒ අනුව මෙම මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | 2024 වර්ෂය සඳහා ආයතනය විධිමත් පවත්වා ගැනීමට අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීමට මේ වන විට ඉල්ලුම්පත් කැඳවා කටයුතු කරමින් පවතින බැවින් අරමුණු ක්‍රියාත්මක කිරීමට හැකිවන බව. | මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

### 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධ හැකියාවන් ඇති ආබාධිත සහිත පුද්ගලයින් වෙනුවෙන් පවත්වන වෘත්තීය පුහුණුව පසුගිය වර්ෂයේදී සාර්ථකව නිම කරන පුහුණුලාභින් හට මෙවලම් කට්ටල ලබාදිම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු. 5,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණත් පසුගිය | එක් එක් අභ්‍යාසලාභියාට ගැලපෙන ආකාරයට විධිමත්ව කුඩා ව්‍යාපාර අංශයේ සම්පත් දායකත්වය ලබා ගෙන ව්‍යාපාර සැලසුම් සකස් කර මෙවලම් කට්ටල ලබා දීම නිසා ප්‍රමාදයක් ඇති වූ නමුත් මේ වන විට තනි පුද්ගල සංවර්ධන සැලසුම් සියළුම අභ්‍යාසලාභීන් වෙත සකස් | පුහුණුලාභීන්ට ප්‍රමාදයකින් තොරව මෙවලම් කට්ටල ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව වෘත්තිය පුහුණුව සාර්ථක ලෙස නිමකල අභ්‍යාසලාභීන් සංඛ්‍යාව 451 දෙනෙකුගෙන් අභ්‍යාසලාභී 5 දෙනෙකුට පමණක් රු. 50,000 ක් වටිනා මෙවලම් කට්ටල ලබාදී තිබුණි. මේ නිසා රු.4,950,000 ක මුදලක් උපයෝජනය කර නොතිබුණි. | කර ඒ අනුව ස්වයං රැකියා කිරීමට සුදුසු පිරිස හඳුනා ගෙන අපේක්ෂිත වැඩ සැලැස්ම සකස්කර ඇති නිසා 2024 වර්ෂයේ දී සිය මෙවලම් කට්ටල ලබා දීම ප්‍රමාදයකින් තොරව සිදුකල හැකිවන බව. | |

## 3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අනාවරණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ දැක්ම අනුව සමාලෝචිත වර්ෂය වන විට ඉලක්ක ගත ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා වූ අපේක්ෂිත ඉලක්කය වෙත ලඟා වීමේ ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ පෙර වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද ඇතුළත් කර නොතිබුණි. | ආයතනයේ කාර්ය සාධනය වෙනුවෙන් ඉලක්ක ලබාදී ඊට අදාළ ප්‍රගතිය ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම සහ එම තොරතුරු ඉදිරියේදී වාර්ෂික කාර්ය සාධනය තුල ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | අංග සම්පූර්ණ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කල යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1992 වර්ෂයේදී මිලදී ගනු ලැබූ පිරිවැය සඳහන් නොවන දෙපාර්තමේන්තුවට අයත් ජල බවුසරය 2021 අගෝස්තු 11 දින විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් මඟින් අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන වාහන යටතේ හඳුනාගෙන අපහරණය කිරීමටද නිර්දේශ කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපහරණ කටයුතු අවසන් කර නොතිබුණි. | ජල බවුසරය කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කරන ලෙසත් අපහරණයේදී මෙම රථය තක්සේරුගත වටිනාකමට අනුව ගැණුම්කරුවෙකු වෙත ලබාදීමෙන් පසුව ඔහු වෙත රථයේ අයිතිය සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් පැවරීමේ පදනම මත අදාල කාර්ය නිම කරන ලෙසත්, 2023 අගෝස්තු 31 දිනැති ලිපිය මඟින් මොණරාගල දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා යවා ඇත. | අපහරණ කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් වාහන තුල පිරිවැය හඳුනාගෙන නොමැති අමුණුකුඹුර සහ තෙළඹුයාය වෘත්තිය පුහුණු ආයතනවල භාවිතාකල ට්‍රැක්ටර් රථ දෙක වත්කම් තුල ඇතුළත් නොකිරිම තුළින් එම වත්කම් අස්ථානගත වීමට හෝ අවභාවිතාවිමට වැඩි ඉඩකඩක් පවතින අතර , දෙපාර්තමේන්තුවේ කුමන කාර්යයන් වෙනුවෙන් මෙම ට්‍රැක්ටර් රථ මිලදී ගත්තේද යන්න අනාවරණය නොවිය. | එකම අංකයෙන් අත් ට්‍රැක්ටර් දෙකක් ඇති බැවින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් තහවුරු කර ඉදිරි කටයුතු කිරීමට නියමිත බව. | මිලදී ගත් ට්‍රැක්ටර් රථ වත්කම් වලට ඇතුලත් කර ගිණුම් ගත කල යුතුය. |
| (ඇ) | අබලි තත්ත්වයේ පවතින මහාමාර්ග අමාත්‍යාංශයට අයත් වෑන් රථය හා සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ජීප් රථය වසර කිහිපයක සිට වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයේ නිශ්කාර්යව ගාල් කර තිබුණි. එම වාහන දෙක ඉගෙනුම් ආධාරක වශයෙන් භාවිතා කිරිමට හෝ වෙනයම් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනිමට සමාලෝචිත වර්ෂය තුළදී ද කළමනාකරණය ක්‍රියා කර නොතිබුණි. | මෙම වාහන කැටවල ආයතනයට ගෙන යාමට විධිමත් පරිදි මිල ගණන් කැඳවා අනුමැතිය ලබා දී ඇති බව හා එම කාර්යය ඉටු කිරීමෙන් අනතුරුව ඉගෙනුම් කටයුතු සඳහා යොදා ගන්නා බව. | ඉගෙනුම් ආධාරක වශයෙන් භාවිතා කිරීමට හෝ වෙනයම් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනිමට කටයුතු කල යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ වෘත්තීය පුහුණු පාඨමාලව සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 11 වෙත බඳවා ගැනීම් සලකා බැලීමේදී මධ්‍යස්ථාන 6 ක් තුල නේවාසික පහසුකම් හා පුහුණුව ලැබීමට ඇති පහසුකම් 450 දෙනෙකු සඳහා පැවතුනද සමාලෝචිත වර්ෂයේදී 288 දෙනෙකු පමණක් පුහුණුවීම් ලබා ගෙන තිබීම නිසා එම මධ්‍යස්ථාන 06 ඌන උපයෝජිත වී තිබුණි. | 2024 වර්ෂයේ දිශානති වැඩසටහන හඳුන්වා දී ඇති අතර එමගින් අභ්‍යාසලාභීන් පාඨමාලා හැරයාම අවමකරගත හැකි බව. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වෙත පුහුණුකරුවන් කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.7 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ සමාලෝචිත වර්ෂය වන විට ආන්තීකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් ප්‍රජාවගේ ස්වභාවය, ප්‍රමාණය හා ඔවුන් භූගෝලීය වශයෙන් විසිරීම පිළිබඳ සංඛ්‍යා ලේඛන, වාර්ෂිකව ඊට අලුතින් එකතුවන ප්‍රමාණයන් පිළිබඳ ඇස්තමේන්තුගත දත්ත, දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන විසින් වාර්ෂිකව සවිබලගන්වනු ලබන ප්‍රජාව පිළිබඳ සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන, දත්ත හා තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | ආබාධ සහිත පුද්ගලයින්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා Child Fund ආයතනය සමඟ එක්ව මූලික කටයුතු සිදුකරන බව. | සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන, දත්ත හා තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමට කඩිනමින් කටයුතු කර යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තිරසර සංවර්ධන අරමුණු යටතේ හඳුනාගෙන තිබූ පළමු සංවර්ධන අරමුණ වන 2023 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම, අධ්‍යාපනයේ සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීම තහවුරු කිරීම සහ ආබාධ සහිත පුද්ගලයන්ට ස්වදේශිකයන්ට සහ අවධානමට ලක් වියහැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම වුවත් දෙපාර්තමේන්තුව සතුව දිවයින පුරා විසිරි සිටින ආබාධ සහිත පුද්ගලයින්, අවධානමට ලක්විය හැකි ළමුන් වැනි මෙම අරමුණට අදාල පාර්ශවයන්ගේ සංඛ්‍යාවන් හා තොරතුරු ඇතුළත් දත්ත | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත සමාජ සේවා නිලධාරීන් හරහා මෙම ආබාධ සහිත හඳුනාගත් ප්‍රජාව සඳහා පුනරුත්ථාපන සැලසුම් සකස් කර අවශ්‍ය සේවාවන් හඳුනාගෙන විධිමත් පරිදි ලබාදීමට සැලසුම් කර ඇති අතර මේ වන විට පුද්ගලයින් 5879 ක් සඳහා පුනරුත්ථාපන සැලසුම් සකස් කර ඇති බව හා . ආබාධ සහිත පුද්ගලයින් 177,809ක සංඛ්‍යාවක් මේ වන විට සමස්ත දිවයින තුලම හඳුනා ගැනීමට හැකිවී ඇති අතර විධිමත් දත්ත පද්ධතියක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව. | 2030 වන විට තිරසර සංවර්ධනය ඉලක්කගත අරමුණ සාක්ෂාත් කරගත හැකි වන පරිදි කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පද්ධතියක් නොමැති වීම හේතුවෙන් වාර්ෂිකව ජයග්‍රහණය දර්ශකය තුලින් 2030 වන විට එම අරමුණ සාක්ෂාත් කර ගැනිමට ඇති හැකියාව අවම මට්ටමක පැවතුනි. | | |
| (ආ) | 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයන් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම තිරසර සංවර්ධන අරමුණු යටතේ හඳුනාගෙන තිබූ දෙවන සංවර්ධන අරමුණ වුවද සමාලෝචිත වර්ෂය තුලදී 214 දෙනෙකු සඳහා පමණක් එම අවස්ථා ලබා දී තිබුණි. දිවයිනම ආවරණය වන පරිදි යාවත්කාලීන කරන ලද ආබාධිත පුද්ගලයින්ගේ සහ යෞවනයන්ගේ දත්ත පද්ධතියකින් තොරව 2030 වන විට මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් ඉලක්කයක් ජයග්‍රහණය කලේද යන්න තහවුරුවක් නොතිබුණි. | 2030 වන විට සාක්ෂාත් කරගැනීමට හැකිවන සේ 2024 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාවේද ඉලක්ක ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | දිවයිනම ආවරණය වන පරිදි වාර්ෂිකව අපේක්ෂිත ඉලක්ක දැක්විය යුතු අතරම දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |